DOI: 10.31357/fhssphd.2005.00093

# සිංහල පුවත්පත් සහ වෙළෙඳ දැන්වීම්කරණය 1860 - 1916

නිහාල් රංජිත් ජයතිලක

**Ph.D.** **2005**

# සිංහල පුවත්පත් සහ වෙළෙඳ දැන්වීම්කරණය
(1860 -1916)

නිහාල් රංජිත් ජයතිලක
ලේඛනාරූඪ අංකය: GS/HU/1474/2001

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ
"ජනසන්නිවේදනය - දර්ශනසූරි" උපාධි
අවසාන පරීක්ෂණය සඳහා ඉදිරිපත් කළ
පර්යේෂණ නිබන්ධය
2005

මෙම නිබන්ධයට ඇතුලත් කර ඇති "සිංහල පුවත්පත් හා වෙළෙඳ දැන්වීම්කරණය" (1860-1916) නම් වූ ස්වාධීන පර්යේෂණ කාර්යය මහාචාර්ය දම්මික ගංගානාත් දිසානායක මහතාගේ උපදේශකත්වය යටතේ සිදු කළ බවත්, මෙම පර්යේෂණයට අදාලව පූර්ණ වශයෙන් හෝ කොටසක් වශයෙන් හෝ කිසිදු වාර්තාවක් වෙනත් උපාධියක්/ඩිප්ලෝමාවක් සඳහා කිසිදු විශ්ව විද්‍යාලයකට හෝ වෙනත් අධ්‍යයන ආයතනයකට හෝ ඉදිරිපත් කර නොමැති බවත් මෙයින් සහතික කර ප්‍රකාශ කරමි.

නිහාල් රංජිත් ජයතිලක

නිහාල් රංජිත් ජයතිලක වන මෙම දර්ශනසූරි උපාධි අපේක්ෂකයා විසින් කරනු ලැබ ඇති ඉහත ප්‍රකාශය සත්‍ය බැව්ද, මාගේ උපදේශකත්වය යටතේ සිදු කළ "සිංහල පුවත්පත් හා වෙළෙඳ දැන්වීම්කරණය" (1860-1916) නම් වූ මෙම පර්යේෂණ නිබන්ධය අගැයීම සඳහා විශ්ව විද්‍යාලයට ඉදිරිපත් කිරීම සුදුසු බැව්ද මම සහතික කරමි.

29/09/2005

මහාචාර්ය දම්මික ගංගානාත් දිසානායක
(උපදේශක)

25 SEP 2005
30 SEP 2005

## අභිප්‍රශංසා සහ පිදුම

මෙම පර්යේෂණයේදී මාගේ අධ්‍යයන උපදේශකතුමා ලෙස පර්යේෂණ මග කියා දෙමින්, ලියූ පරිච්ඡේද ගැඹුරින් විමසා අවැසි සංශෝධන පෙන්වා දෙමින්, මා දිරිමත් හා ශක්තිමත් කළ මහාචාර්ය දම්මික ගංගානාත් දිසානායක ගුරුපියාණන්ට මුලින්ම ගෞරව ප්‍රණාමය පුදමි.

2001 වසරේදී අධ්‍යනාංශ ප්‍රධාන වශයෙන් මෙම පර්යේෂණ මාතෘකාව නිර්දේශ කරමින් සම්මන්ත්‍රණ පත්‍රිකා සැලසුම් කිරීමේදී මහපෙන්වීම් කරමින් තිබඳව මා උනන්දු කළ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය තිස්ස කාරියවසම් ගුරුපියාණන්ද, අනතුරුව අධ්‍යනාංශ ප්‍රධාන වශයෙන් පූර්ව සම්මන්ත්‍රණ පත්‍රිකා ඉදිරිපත් කිරීමේදී උපදෙස් ලබා දෙමින් මා ධෛර්යමත් කළ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුනිල් ආරියරත්න ගුරු පියාණන්ද බැති සිතින් සිහි කරමි.

අනුමත මාතෘකා අනුව මුලින් ඉදිරිපත් කළ සම්මන්ත්‍රණ පත්‍රිකා දෙක උත්තීර්ණ කිරීමට සුදුසු තත්වයක පැවති බැවින් දර්ශනපති අපේක්ෂකත්වය, දර්ශනසූරි බවට පත්කිරීම නිර්දේශ කළ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය තිස්ස කාරියවසම්, ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුනිල් ආරියරත්න, මහාචාර්ය දම්මික ගංගානාත් දිසානායක යන විද්වතුනට යළි බැතියෙන් හිස නමමි.

මෙම පර්යේෂණයට සහාය කරගත හැකි ශාස්ත්‍රීය පොත පත මෙන්ම ඉංග්‍රීසි කෘති පිළිබඳවද තොරතුරු ලබා දෙමින් මා පුබුදු කළ ආචාර්ය නන්දන කරුණානායකයන්ද, කොළඹ විශ්ව විද්‍යාලයේ ජනසන්නිවේදන ඩිප්ලෝමා විභාගය ඔස්සේ ජනසන්නිවේදනය ගැඹුරින් හැදෑරීමට මා මෙහෙයවූ මහාචාර්ය ජේ.බී.දිසානායක හා එඩ්වින් ආරියදාස යන ගුරු පියවරුන්ද ගෞරවයෙන් සිහිපත් කරමි.

එසේම පර්යේෂණ කටයුතු සඳහා පැරණි ග්‍රන්ථ කීපයක් ලබා දෙමින් මා දිරිමත් කළ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය ප්‍රණීත් අභයසුන්දරයන්ටද කෘතවේදිත්වය පළ කරමි.

තවද පර්යේෂණය වෙනුවෙන් උපයෝගී කර ගත් පැරණි සිංහල හා ඉංග්‍රීසි පුවත්පත්, ගැසට් පත්‍ර, වෙනත් ලිපි ලේඛන ආදිය පරිශීලනය කිරීමට හා ජායාස්ථිත පිටපත් ලෙස ලබා ගැනීමට පහසුකම් සැලසූ ජාතික ලේඛනාගාර අධ්‍යක්ෂ ආචාර්ය සරෝජා වෙත්තසිංහ මහත්මිය ඇතුලු කාර්ය මණ්ඩලයටද තුති පුදමි.

**නිහාල් රංජිත් ජයතිලක**

2005.09.27

## සිංහල පුවත්පත් සහ වෙළෙඳ දැන්වීම්කරණය (1860 - 1916)


**පළමුවැනි පරිච්ඡේදය: හැඳින්වීම** 1 - 24

1.1 පර්යේෂණ මාතෘකාව 1 - 6
1.2 අධ්‍යයනයේ පසුබිම 6 - 8
1.3 අරමුණු හා උපන්‍යාසය 9 -10
1.4 ක්‍රමවේදය 10 - 21
1.5 අධ්‍යයනයේ සීමා 22 - 23
1.6 නිබන්ධයේ ව්‍යුහය 23 - 24

**දෙවැනි පරිච්ඡේදය: පුවත්පත් හා පුවත්පත් දැන්වීම්කරණය පිළිබඳ ඓතිහාසික විග්‍රහය** 25 - 42

2.1 පුවත්පත් ආරම්භය හා අන්තර්ජාතික ප්‍රවණතා 25 - 31
2.2 පුවත්පත් වෙළෙඳ දැන්වීම් ආරම්භය 32 - 42

**තුන්වැනි පරිච්ඡේදය: ශ්‍රී ලාංකීය පුවත්පත් ප්‍රකාශනය** 43 - 158

3.1 ශ්‍රී ලාංකීය පුවත්පත් ප්‍රකාශනය හා ව්‍යාප්තිය කෙරෙහි බලපෑ ආර්ථික, සමාජ හා ආගමික පසුබිම 43 - 72
3.2 මුලිකාලීන ඉංග්‍රීසි හා දෙමළ පුවත්පත් 72 - 88
3.3 1860 - 1916 කාලය තුළ ප්‍රකාශිත ප්‍රධාන ධාරාවේ සිංහල පුවත්පත් 88 -158

**සිව්වැනි පරිච්ඡේදය: සිංහල පුවත්පත් වෙළෙඳ දැන්වීම් හා සමාජ ආර්ථික බලපෑම** 159 - 479

4.1 සිංහල පුවත්පත් වෙළෙඳ දැන්වීම් කෙරෙහි බලපෑ සමාජ ආර්ථික කරුණු 159 - 171
4.2 මුල්කාලීන ඉංග්‍රීසි පුවත්පත් දැන්වීම් හා 1860 - 1916 අතර කාලය තුළ ප්‍රකාශිත ප්‍රධාන ධාරාවේ සිංහල පුවත්පත් දැන්වීම් 171 - 287
4.3 සිංහල පුවත්පත් දැන්වීම්වල අන්තර්ගත හා ආකෘතික ලක්ෂණ පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනය 288 - 427
4.4 1860 - 1914 අවදියේ සිංහල පුවත්පත් වෙළෙඳ දැන්වීම්වල අන්තර්ගත සහ ආකෘතික ලක්ෂණ ඩී.ආර්.විජයවර්ධන අයිතිය යටතේ 1915-1916 දිනමිණ පත්‍රයේ දැන්වීම් සමඟ තුලනාත්මක විශ්ලේෂණය 427 - 479

**පස්වැනි පරිච්ඡේදය: සමාලෝචනය** 480 - 499

උප ග්‍රන්ථය - 1 500
උප ග්‍රන්ථය - 2 501 - 523
ආශ්‍රිත ග්‍රන්ථ, ලිපි හා පුවත්පත් 524 - 529

# සිංහල පුවත්පත් සහ වෙළෙඳ දැන්වීම්කරණය
(1860 - 1916)

## පළමුවැනි පරිච්ඡේදය: හැඳින්වීම

### 1.1 පර්යේෂණ මාතෘකාව

මෙරට බිහි වූ මුල්ම සිංහල පුවත්පත ලෙස පිළිගැනෙන 1860 දී මුල්වරට පළවූ "ලංකා ලෝකය" පත්‍රයේ සිට 1916 වසර දක්වා වූ පනස් හය වසරක කාලය තුළ මුද්‍රිත ප්‍රකාශන වශයෙන් එළි දුටු ප්‍රධාන ධාරාවට අයත් සිංහල පත්‍ර මෙම පර්යේෂණ මාතෘකාව සඳහා පාදක කර ගෙන ඇත.

ජාතික ලේඛනාධිකාරීන්ගේ නිගමනය පරිදි ලංකාණ්ඩුවේ ලියාපදිංචි කර ඇති පැරණිතම හා ප්‍රථම සිංහල පුවත්පත ලෙස සැලකෙන්නේ 1862.09.11 වැනි දින නිකුත් වූ "ලක්මිණි පහණ" පත්‍රයයි. එහෙත්, "සිංහල පුවත්පත් සහරා ඉතිහාසය" කෘතියේ සඳහන් වන්නේ "ලංකාලෝකය" නමැති පත්‍රය ලංකාවේ මුලින්ම ප්‍රසිද්ධියට පත් සිංහල පුවත්පත බවයි. [1]

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ මැදිහත්වීමෙන් 1974 වසරේදී සිදු කළ පර්යේෂණයකදී එනෙක් නමින් පමණක් හඳුනාගෙන මෙරට ප්‍රකාශිත මුල්ම සිංහල පත්‍රය සේ සැලකූ "ලංකාලෝකය" පත්‍රයේ පැරණිම පිටපත, එනම් 1860.09.10 දින නිකුත්ව තිබූ පත්‍රය සොයා ගැනිණ.[2] කෙසේ වුවද, ජාතික ලේඛනාගාරයේ වාර්තා අනුව "ලංකාලෝකය" පත්‍රය රජයේ ලියා පදිංචි කළ බවට සාධක නැත.

මෙම පදනමට අනුව, ලංකාණ්ඩුවේ ලියාපදිංචි කළ හා නොකළ 1860-1916 කාලය තුළදී ප්‍රකාශිත සිංහල පුවත්පත් සංඛ්‍යාව 109 ක් පමණ වේ. [3]

ප්‍රකාශිත අරමුණු හා පරමාර්ථ අනුවද, කොළඹින් හා ප්‍රාදේශීය නගරවලින් ප්‍රකාශයට පත් කිරීම සහ නිකුත් කළ කාල පදනම සැලකීමේදී ද මෙම පත්‍ර ක්ෂේත්‍ර කීපයකට වෙන් කළ හැකිය. මෙම පුවත්පත් අතරින් බොහොමයක් වසරකට, දෙකකට හෝ තුනකට අඩු කාලයකදී මුද්‍රණයෙන් එළි දැක්වීම නතර වී තිබේ. [4]

---

1. ප්‍රඥාශේඛර නාහිමි, කලුකොඳයාවේ "සිංහල පුවත්පත් සහරා ඉතිහාසය" ප්‍රථම කාණ්ඩය 1832-1887 කොළඹ 1965. ජෝන් මර්ඩොක් හා ජේම්ස් නිකල්සන් දේවගැතිතුමා විසින් 1868 දී ප්‍රසිද්ධියට පමුණුවනු ලැබූ "Classified Catalogue of Printed Tracts and Books in Sinhalese" නම් ඉංග්‍රීසි පොතේ "ලංකාලෝකය" පිළිබඳ ලුහුඬු සටහනක් ඇතුළත් බවත්, ඒ අනුව "ලංකාලෝකය" 1860 ජූනි මාසයේ ආරම්භ කරන ලද බවත් " සිංහල පුවත්පත් සහරා ඉතිහාසය" කෘතියේ "ලංකාලෝකය" පත්‍රය සම්බන්ධ සටහනේ වැඩිදුරටත් දැක්වේ.

2. මේ පිළිබඳ විග්‍රහයක් 3 වැනි පරිච්ඡේදයේ "ලංකාලෝකය" පුවත්පත යටතේ දැක්වේ.

3. "සිංහල පුවත්පත් සහරා ඉතිහාසය" (කාණ්ඩ අංක 1 සිට 4 දක්වා) කෘතිය පරිශීලනය කිරීමෙන් හා තත් කාලයේ ප්‍රකාශිත වෙනත් සිංහල පත්‍ර හා සහරාවල දැක්වෙන හැඳින්වීම්, සුබපැතුම් ආදිය පාදක කර ගැනීමෙන් මෙම සංඛ්‍යාව පිළිබඳ නිගමනයකට පැමිණ ඇත.

4. " සිංහල පුවත්පත් සහරා ඉතිහාසය" (කාණ්ඩ අංක 01 සිට 04 දක්වා)

මෙහිදී ප්‍රධාන ධාරාවේ සිංහල පත්‍ර හැටියට පහත සඳහන් පුවත්පත් තෝරා ගැනීමේදී තීරණායක කීපයක්ම භාවිත කෙරිණ.

ශ්‍රී ලංකාවේ බිහිවූ මුල්ම සිංහල පත්‍රය හැටියට "ලංකා ලෝකය" ත් (1860) , රජයේ ලියාපදිංචි කළ මුල්ම පුවත්පත ලෙස "ලක්මිණි පහණ" ත් (1862), පැරණිතම සිංහල පත්‍ර වශයෙන් තෝරා ගැනිණි. දෙසති පත්‍රයක් ලෙස 1860 දී ඇරඹුණු "ලංකා ලෝකය" වසරකට ආසන්න කාලයකදී නැවතී යළි සතිපතා පත්‍රයක් වශයෙන් 1886.08.04 දින ආරම්භ කර ඇත. 1862.09.11 දින එළි දුටු "ලක්මිණි පහණ" පස් වතාවක් පමණ නතර වෙමින් වුවත්, අවුරුදු 70 ඉක්ම වූ කාලයක් තුළ ප්‍රකාශයට පත්වූවකි.[5]

සිංහල පත්‍ර ඉතිහාසයේ තුන්වැනි පත්‍රය හා රජයේ ලියාපදිංචි කළ දෙවැනි පුවත්පත වූ "ලක්රිවි කිරණ" 1863.07.04 දින ආරම්භ කර 1884 දක්වා වසර 21 ක් නොකඩවා පළ කිරීමෙන් 1860 ගණන්වල බිහිවූ සිංහල පත්‍ර අතර, විශේෂත්වයක් හිමි කර ගෙන ඇත. 1884 සිට කෙටි කලක් නතර වුවද, යළි 1890 සිට 1897 දක්වාත්, 1901 සිට 1902 දක්වාත් ප්‍රකාශයට පත් කර තිබේ.[6] ඒ අනුව වසර 30 කට ආසන්න ප්‍රකාශන කාලයක් සහිත "ලක්රිවි කිරණ" ප්‍රධාන ධාරාවේ පත්‍රයක් ලෙස සලකා ඇත.

කතෝලික ආගමික පුවත්පතක් ලෙස 1866.06.07 දින බිහි වූ "ඥානාර්ථ ප්‍රදීපය" අවස්ථා කීපයකදීම නතර කිරීමට සිදු වුවත්, සිංහල පුවත්පත් ඉතිහාසයේ ආරම්භයේ පටන් මෑත අවදිය දක්වාම අතිශය දිගු කලක් ප්‍රකාශයට පත් වූවකි.[7] කිතුනු ආගමික අරමුණු ප්‍රමුඛ වුවද, ඉංග්‍රීසි යටත් විජිත යුගයේ ස්වදේශික ජනතාව මුහුණ දුන් විවිධ ප්‍රශ්න සම්බන්ධයෙන් ජනමතය ප්‍රකාශ කිරීමේ වගකීමද දැරූ "ඥානාර්ථ ප්‍රදීපය" එම විශේෂිත කරුණු නිසා ප්‍රධාන ධාරාවට තෝරා ගන්නා ලදී. එසේම, 1880.12.03 දින සතිපතා පත්‍රයක් ලෙස ඇරඹූ "සරසවි සඳරැස" පත්‍රයද 1880 සිට 1940 දක්වාත්, 1943 සිට 1949 දක්වාත්, වසර 66 ක පමණ කාලයක් ප්‍රසිද්ධියට පත් කර තිබීම [8] අපගේ පුවත්පත් නියැදියට එක් කිරීමට හේතු විය.

---

5. 6. 7. 8. ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ සමරු කළඹ - 2000

1885 මාර්තු 25 දින එළි දැක්වුණු "දිනකර ප්‍රකාශය" පත්‍රය ප්‍රධාන ධාරාවට ඇතුලත් කරන ලද්දේ ආගමික අවශ්‍යතා ප්‍රතික්ෂේප කරමින් ස්වාධීන පුවත්පතක් ලෙස ප්‍රකාශයට පැමිණ වූ ප්‍රථම පත්‍රය වූ බැවිනි. මෙය ජනප්‍රිය පුවත්පතක් වූවා පමණක් නොව, අනෙකුත් ආරම්භක සිංහල පත්‍ර හා සැසඳීමේදී ඉතා දීර්ඝ කාලයක් අඛණ්ඩව පවත්වාගෙන යනු ලැබූ පුවත්පත ද විය. සතිපතා පත්‍රයක් ලෙස අරඹා දෙවසරකින් සතියකට දෙවරක් පළ කරනු ලැබූ මෙය, පසුව සතියකට සිව් වතාවක් නිකුත් කෙරිණ.[9]

1860 -1895 දක්වා වූ තිස්පස් වසරක කාලය තුළදී සිංහල දිනපතා පත්‍ර කිසිවක් ප්‍රකාශයට පත් නොවිණ. පත්‍ර නිකුත් වීමේ කාල පදනම වූයේ සතිපතා, සතියකට දෙවරක්, තෙවරක් හෝ සිව් වරක්, දෙසති, මාසික, මසකට තෙවරක් ආදී වශයෙනි. එහෙත්, 1895.03.07 දින ප්‍රථම සිංහල දිනපතා පත්‍රය "දිනපතා ප්‍රවෘත්ති" නමින් බිහි විය. මෙය ඉතා ඉහළ මට්ටමකින් ආරම්භ කරන ලද බවත්, ප්‍රථමයෙන් පත්‍ර 30,000 ක් අච්චු ගස්වා බෙදා හරින ලද බවත් "ලක්මිණි පහණ" වාර්තා කර තිබිණ. [10]

පර්යේෂණ මාතෘකාව සඳහා පාදක කර ගන්නා ප්‍රධාන ධාරාවේ පත්‍ර අතරට 1908.01.18 දින නිකුත් වූ "සිංහලයා" පත්‍රය ඇතුලත් කරන ලද්දේ සිංහල පුවත් පත් ඉතිහාසයේ ශාස්ත්‍රීය අතිරේකයක් නිකුත් කළ ප්‍රථම පුවත්පත එය වූ බැවිනි.[11]

සිංහල පත්‍ර ඉතිහාසයේ තුන්වැනි දිනපතා පත්‍රයද, ශාස්ත්‍රීය අතිරේකයක් නිකුත් කළ දෙවැනි පත්‍රයද ආරම්භක අවදියේ සිට වත්මන දක්වාම අඛණ්ඩව ප්‍රකාශිත සිංහල දිනපතා පත්‍රයද වන "දිනමිණ" 1909.12.17 දින නිකුත් වූයේ එච්.එස්.පෙරේරා කර්තෘ මූලික ප්‍රකාශනයක් ලෙසිනි. පසුව, 1914 අග භාගයේදී එය ඩී.ආර්.විජයවර්ධන අයිතිය යටතට පත්ව, අන්තර්ගත හා ආකෘතික වශයෙන් දියුණු පත්‍ර කලාවක ලක්ෂණ පෙන්නුම් කෙරිණ. [12]

ආගමික කරුණු මුල් කරගෙනම ප්‍රකාශයට පත් වූ පත්‍ර දෙකක්ද 1860-1916 අතර ප්‍රධාන ධාරාවේ පුවත්පත් වශයෙන් මෙම අධ්‍යයනය සඳහා පරිශීලනය කෙරිණ. 1873.10.01 දින සිට ප්‍රකාශිත

9. දැල බණ්ඩාර, ගාමිණී. "සිංහල පුවත්පත් ප්‍රභවය සහ අභිවර්ධනය" - 1993 - සහ "දිනකර ප්‍රකාශය" ආරම්භක පත්‍රයේ කතු වැකිය.

10. ලක්මිණි පහණ - 1895.03.23

11. "සිංහල පුවත්පත් සහරා ඉතිහාසය" (1908 - 1918) 4 කාණ්ඩය - 1968
"සිංහලයා" පත්‍රයේ දායක මහතුන්ට සතිපතා නොමිලේ දීම සඳහා පිටු 8 කින් යුත් මෙම අතිරේකය (සහරාව) හඳුන්වා ඇත්තේ "ශාස්ත්‍ර සමුච්චය" නමිනි.

12. හුළුගල්ල එච්.ජ්.ජේ, තිශ්ශංක, පියසේන "ඩී.ආර්.විජයවර්ධන චරිතය" - 1962

"සත්‍යාලංකාරය" පුවත්පත කතෝලික ආගමේ උන්නතිය හා කිතුනු ජනයාගේ සුභසිද්ධිය මුල් කර ගෙන නිකුත් වූවකි. [13] මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමිපාණන්ගේ සංස්කාරකත්වය යටතේ කොටහේනේ දීපදුත්තමාරාමයෙන් නිකුත් කරන ලද "සත්‍ය මාර්ගය" නම් පත්‍රයද අපගේ අධ්‍යයනයට පාදක කර ගැනිණි. 1867.08.31 දින ඇරඹුණු මේ පත්‍රයේ ප්‍රධාන පරමාර්ථය වූයේ ක්‍රිස්තු ලබ්ධිකයන් විසින් බුද්ධාගම විවේචනය කරමින් පළ කරවන ලිපි ලේඛනවලට පිළිතුරු දීම සඳහා කටයුතු කිරීමය.[14]

1860 -1916 අවදිය තුළ බිහිවූ සිංහල පත්‍ර අතර ප්‍රාදේශීය පුවත්පත් කීපයක් ද වේ. අපගේ පර්යේෂණ අවශ්‍යතාව සඳහා නියැදිය තෝරා ගැනීමේදී ප්‍රධාන ධාරාවේ පත්‍ර හැටියට එම ප්‍රාදේශීය පුවත්පත් අතරින් දෙකක් ද උපයෝගී කර ගැනිණි. ඩී.බී.ජයතිලකගේ කර්තෘත්වයෙන් සතිපතා පත්‍රයක් ලෙස 1895.01.31 දින මහනුවරින් නිකුත් වූ "සත්‍යෝදය" පුවත්පත මහනුවර පරමවිඥානාර්ථ බෞද්ධ සමාගම වෙනුවෙන් ප්‍රකාශයට පත් වූවකි.[15] 1895.12.20 දින ප්‍රාදේශීය පත්‍රයක් වශයෙන් මොරටුවෙන් නිකුත් වූ "සත්මිණි කිරුළ" සතියකට වරක් ප්‍රකාශයට පත් විය.[16]

සිංහල පුවත්පත්වල ආගම් හා ධර්ම ශාස්ත්‍රීය කරුණු පිළිබඳ තියුණු වාද විවාද බහුල අවදියක එම පරමාර්ථයෙන් බැහැරව, විනෝදාස්වාදය මුල් කර පුවත්පත් පළවීම පාඨකයාගේ ප්‍රබෝධය පිණිස හේතු වන්නට ඇතැයි උපකල්පනය කළ හැක්කේ 1872 බිහි වූ "කවට කතිකයා" පත්‍රය අනුකරණය කරමින් 1872 - 1916 අතර කාලයේදී විවිධ නාම සිරස්තල යටතේ කවට පත්‍ර රාශියක් බිහිවීම නිසාය.[17] මෙම කරුණ ද අපගේ සැලකිල්ලට ලක්විණ. එම නිසා 1860 - 1916 අතර අවදියේ ප්‍රකාශිත ප්‍රධාන ධාරාවේ සිංහල පුවත්පත් නියැදිය වෙනුවෙන් කවට කතිකයා, කවට මිත්‍රයා සහ කවටයා යන නම්වලින් යුත් කවට පත්‍ර තුනද උපයෝගී කර ගැනිණ.

අපගේ පර්යේෂණ මාතෘකාව සඳහා ප්‍රධාන ධාරාවේ පත්‍ර සේ සලකා විවිධ වර්ගීකරණයන් යටතේ පාදක කර ගත් පුවත්පත් බහුතරයක්ම තත් කාලයේ ස්වදේශික පාඨකයන් අතර බෙහෙවින් ජනප්‍රියත්වයට පත්ව තිබූ පත්‍ර වශයෙන් ද සැලකිය හැකිය.[18]

---

13. 14. "සිංහල පුවත්පත් සඟරා ඉතිහාසය" - ප්‍රථම කාණ්ඩය (1832 1887)
15. 16. "සිංහල පුවත්පත් සඟරා ඉතිහාසය".- දෙවැනි කාණ්ඩය (1888 -1900)
17. "සිංහල පුවත්පත් සඟරා ඉතිහාසය" - දෙවැනි කාණ්ඩය (1888 -1900)
18. . "සිතුමිණ සඟරාව" 1895 දෙසැම්බර් කලාපය

1895 දෙසැම්බර් මාසයේ ප්‍රකාශිත "සිතුමිණ" සඟරාවේ කාලීන ප්‍රවෘත්ති පත්‍ර සම්බන්ධ කර "මහත්මයා වැඩි ගරු කොට සලකන සිංහල ප්‍රවෘත්ති පත්‍ර මොනවාද?" යනුවෙන් ප්‍රශ්නයක් අසා ඇත. ඊට ලැබුණු උත්තර පත්‍ර 384 අනුව පාඨක මනාපයෙන් මුල් ස්ථාන 10 ට පත් වූ සිංහල පත්‍ර අනුපිළිවෙල මෙසේ විය.[19]

1. සරසවි සඳරුස
2. ලක්රිවි කිරණ
3. දිනකර ප්‍රකාශය
4. දිනපතා ප්‍රවෘත්ති
5. ලක්මිණි පහණ
6. සත්‍යෝදය
7. ඥානාර්ථ ප්‍රදීපය
8. ශ්‍රී ලංකොත්තංශය
9. ලංකා ප්‍රදීපය
10. සත්මිණි කිරුළ

මෙම පත්‍ර දහය අතරින් පත්‍ර අටක්ම අපගේ අධ්‍යයනය වෙනුවෙන් ප්‍රධාන ධාරාවේ පත්‍ර ලෙස උපයෝගී කරගත් ඒවාය. 1895 වසර වන විට "ලංකාලෝකය" දෙවනවර ප්‍රකාශයට පත්වීමද, "සත්‍ය මාර්ගය" ප්‍රසිද්ධ කිරීමද නතර වී තිබුණු අතර, "සිංහලයා" පත්‍රය බිහිව නොතිබිණි.

පර්යේෂණ කාල සීමාවේ අවසාන වසර ලෙස 1916 වසර තෝරා ගැනීමට හේතු වූ කරුණු කීපයකි. 1909.12.17 දින "දිනමිණ" දිනපතා පත්‍රයක් ලෙස බිහි වූයේ, එච්.එස්.පෙරේරාගේ (කර්තෘ) මුලිකත්වයෙන් යුතු ප්‍රකාශනයක් වශයෙනි.[20] "දිනමිණ" 1914 වසරේ අග භාගයේදී ඩී.ආර්.විජයවර්ධන අයිතිය යටතට පත් විය. 1909-1914 දක්වා රොබට් බටුවන්තුඩාවගේ ලංකාහිතව විශ්‍රුත මුද්‍රණාලයේ ඩිමයි බාගේ කුඩා පත්‍රයක් හැටියට එළි දුටු "දිනමිණ" පත්‍රය, නව අයිතිය තුළ නව කර්තෘ මණ්ඩලයක් යටතේ නව මුද්‍රණාලයක පත්‍රය විශාල කර ප්‍රකාශයට පත් කර ඇත.[21]

"දිනමිණ" නව යුගයකට ප්‍රවේශ වී අන්තර්ගත හා ආකෘතික වශයෙන් පැහැදිලි වෙනස්කම් දැකිය හැකි වන්නේ 1915 වසරේ අග සහ 1916 වසරේ මුල සිටය. විශේෂයෙන් දිනමිණ පත්‍රයේ අන්තර්ගත ප්‍රවෘත්ති හා විශේෂාංග හැරුණු විට, වෙළෙඳ දැන්වීම් අන්තර්ගතය හා ඒවායේ ආකෘතික ලක්ෂණ තුළ මෙම පරිවර්තනය දැකිය හැකිය. ඒ අනුව නූතන පුවත්පත් දැන්වීම්වල මූලාරම්භය 1915/1916 වසරේ සිට දිනමිණ පත්‍රය තුළ අන්තර්ගතවීම, ඩී.ආර්.විජයවර්ධන විසින් දිනමිණ මිලට ගත් 1914 වසර වෙනුවට, 1916 වසර පර්යේෂණ මාතෘකාවේ අවසානය සනිටුහන් කිරීම සඳහා උපයෝගී කර ගැනීමට බලපෑ ප්‍රමුඛ කරුණ විය.

---

19. "සිතුමිණ සඟරාව" 1895 දෙසැම්බර් කලාපය

20. සිංහල පුවත්පත් ඉතිහාසයේ "දිනමිණ" ට හිමි විශේෂත්වය පිළිබඳව මෙම නිබන්ධයේ 3 වැනි පරිච්ඡේදයේ "1860 - 1916 කාලය තුළ ප්‍රකාශිත ප්‍රධාන ධාරාවේ සිංහල පුවත්පත්" ශීර්ෂය යටතේ විස්තර කර ඇත.

21. "ඩී.ආර්.විජයවර්ධන" චරිතය - 1962

පර්යේෂණ මාතෘකාවේ සුවිශේෂී අංශය වන "වෙළෙඳ දැන්වීම්කරණය" යන ශීර්ෂ පාඨයෙන් අර්ථ දැක්වීමට අදහස් කරන්නේ, 1860 - 1916 කාලය තුළ ප්‍රකාශිත ඉහත දැක්වූ සිංහල පත්‍රවල ඇතුළත් පාරිභෝගික, කාර්මික හා වාණිජ යන අංශ තුනටම අයත් භාණ්ඩ, සේවා සහ අදහස්වලට අදාළ දැන්වීම් විමර්ශනාත්මකව අධ්‍යයනය කිරීමයි. මෙහිදී වාණිජ ගණයට අයත් දැන්වීම් මෙන්ම, වාණිජ නොවන දැන්වීම්ද විශ්ලේෂණයට භාජනය කෙරේ.

මේ ආකාරයට අදාළ පුවත්පත්හි අන්තර්ගත වාණිජ හා වාණිජ නොවන දැන්වීම් පිළිබඳව විග්‍රහ කිරීමේදී ස්ත්‍රී-පුරුෂ වශයෙන්, ආගම් ජාති වශයෙන්, භාෂා වශයෙන් කවර හෝ බෙදීමකට ලක් නොකෙරේ.

මෙම දැන්වීම් විශ්ලේෂණය කිරීමේදී භාණ්ඩ, සේවා හා අදහස්වලට අදාළ දැන්වීම්වල වර්ගීකරණය, මුඛ්‍ය පාඨ (ශීර්ෂ පාඨ), පෙළ, නිර්මාණශීලීත්වය, ඉදිරිපත් කිරීමේ රටාව, පණිවිඩය පැහැදිලි කිරීම සඳහා චිත්‍ර/රූ සටහන් භාවිතය, ඉලක්ක පාරිභෝගික පිරිස, භාෂාව, දැන්වීමේ ප්‍රමාණය, ස්ථානගත කිරීම යන අන්තර්ගත හා ආකෘතික ලක්ෂණද ඉංග්‍රීසි පුවත්පත් දැන්වීම්වල බලපෑම ආදී කරුණුද සැලකිල්ලට ගෙන ඇත.

## 1.2 අධ්‍යයනයේ පසුබිම

"සිංහල පුවත්පත් සහ වෙළෙඳ දැන්වීම්කරණය" මැයෙන් යුතු මෙම පර්යේෂණ නිබන්ධයේ මුඛ්‍ය තේමාව වන්නේ මුල්කාලීන සිංහල පුවත්පත්වල ඇතුළත්ව තිබූ වෙළෙඳ දැන්වීම් පිළිබඳව හා ඒ සඳහා බල පෑ සමාජ, ආර්ථික පසුබිම විමර්ශනාත්මකව අධ්‍යයනය කිරීමයි. මෙහිදී පර්යේෂණ මාතෘකාවේ අධ්‍යයනයට අදාළ දෙස් විදෙස් පසුබිම් කරුණු ද විවරණය කෙරේ. පුවත්පත් හා පුවත්පත් ප්‍රචාරණයේ ඓතිහාසික විකාශනයද, මෙරට පුවත්පත් ප්‍රකාශනයට බල පෑ ආර්ථික, සමාජ හා ආගමික සාධකද අධ්‍යයනයේ පසුබිම ගොඩනැඟීම සඳහා පාදක කර ගෙන ඇත. ශ්‍රී ලංකාවේ සිංහල පුවත්පත් බිහිවීමට පෙර යුගයේ ප්‍රකාශිත ඉංග්‍රීසි හා දෙමළ පුවත්පත්වල ආරම්භය හා ව්‍යාප්තිය ගැනත්, විශේෂයෙන් සිංහල පුවත්පත් දැන්වීම්වල අන්තර්ගත හා ආකෘතික ලක්ෂණවලට බලපෑ මුල්කාලීන හා සමකාලීන ඉංග්‍රීසි පුවත්පත්වල වෙළෙඳ දැන්වීම් පිළිබඳවත් මෙම අධ්‍යයනයෙන් විමසුමට ලක් කර තිබේ.

මෙවැනි විෂය ක්ෂේත්‍රයක් පිළිබඳව ඓතිහාසික හා විචාරාත්මක අධ්‍යයනයක් මීට පෙර සිදු කර ඇති බවට සාධක හමු නොවේ. වෙළෙඳ දැන්වීම් අන්තර්ගතය නොසලකා මුල්කාලීන සිංහල පුවත්පත් හා සමාජ ආර්ථික පසුබිම සම්බන්ධව සිදු කර ඇති අධ්‍යයනයන් කීපයක තොරතුරු අපගේ අවධානයට ලක් විය.

1965 වසරේ සිට මුද්‍රණයෙන් නිකුත් වූ කලුකොඳයාවේ ප්‍රඥාශේඛර මාහිමියන් ලියූ "සිංහල පුවත්පත් සඟරා ඉතිහාසය" නමැති පොත් පෙළ මෙරට මුල්කාලීන සිංහල පත්‍ර හා සඟරා පිළිබඳව ප්‍රථමයෙන්ම කරනු ලැබූ විස්තරාත්මක හා ඓතිහාසික අධ්‍යයනයක් ලෙස සැලකිය හැකි වුවත්, මෙම කෘතිය තුළ තත්කාලීන සමාජ, ආර්ථික, ආගමික හා දේශපාලන සාධක ගැන පූර්ණ අවධානයක් යොමු කිරීමට ඉඩ ප්‍රස්තා තිබී නැති බව පෙනී යයි.

මොස්කව් සරසවියේ ආචාර්ය උපාධිය සඳහා අධ්‍යයනයක් කළ ආචාර්ය රෝහණ ලක්ෂ්මන් පියදාස මහතා ශ්‍රී ලංකාවේ නිදහස් ව්‍යාපාරය සඳහා දිනමිණ පුවත්පතේ කාර්යභාරය පිළිබඳව විමසුමක යෙදී ඇත. සිය ශාස්ත්‍රපති උපාධි නිබන්ධය මූලික කොට ආචාර්ය සරත් අමුණුගම මහතා ශ්‍රී ලංකාවේ නූතන සිංහල ජාතිවාදයේ නැගීම සම්බන්ධයෙන් සිංහල පුවත්පත්වල ක්‍රියා කලාපය විමසුමට ලක් කොට තිබේ. මෙම පර්යේෂණ නිබන්ධ මගින් මුල්කාලීන සිංහල පුවත්පත්වල ප්‍රචාරණ ක්‍රියාවලිය පිළිබඳව අවධානය යොමු කිරීමකට පසුබිමක් ගොඩ නැගී නැත.

ගාමිණී විජේතුංග මහතා කැලණිය විශ්ව විද්‍යාලයේ ජන සන්නිවේදනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය සඳහා "පුවත්පත්වල අයිතිය හා පාලනය යන සාධක, එහි දේශපාලන සන්නිවේදනයේ විශ්වසනීයත්වය කෙරෙහි ඇති කරන බලපෑම" යන මැයෙන් ඉදිරිපත් කළ නිබන්ධනයෙන් වැඩි අවධානය යොමු කර ඇත්තේ පුවත්පත් අයිතිය හා දේශපාලන සන්නිවේදනය කෙරෙහිය. සිංහල පත්‍ර ඉතිහාසය පිළිබඳ විශාල වපසරියක් හෝ පුවත්පත්වල අන්තර්ගත හා ආකෘතික ලක්ෂණ පිළිබඳ විශේෂ විමසුමක් හෝ එමගින් ආවරණය නොවේ.

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍රපති උපාධියට පාදක වූ පර්යේෂණ නිබන්ධය සඳහා "සිංහල පුවත්පත් විකාශනය-1860 සිට 1930 දක්වා" යන මාතෘකාවෙන් කිත්සිරි කාරියප්පෙරුම මහතා විසින් අධ්‍යයනයක් කර ඇත. එහිදී ඔහුගේ ප්‍රධාන අවධානය යොමු වී තිබෙන්නේ 1860-1930 දක්වා කාලයේ පළවූ සිංහල පුවත්පත්වල අන්තර්ගත ශාස්ත්‍රීය කරුණු කෙරෙහිය.

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ජන සන්නිවේදනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධි අවසන් පරීක්ෂණය සඳහා "විවෘත ආර්ථිකය තුළ ශ්‍රී ලාංකීය වෙළෙඳ ප්‍රචාරණය - මුද්‍රිත මාධ්‍ය අධ්‍යයනයක්" යන මැයෙන් නිහාල් රංජිත් ජයතිලක මහතා 1999 දී පර්යේෂණ නිබන්ධයක් ඉදිරිපත් කර තිබේ. එමගින් විමසුමට භාජනය කර ඇත්තේ 1978 සිට මෙරට ක්‍රියාත්මක වූ නිදහස් වෙළෙඳපොළ ආර්ථික ක්‍රමය තුළ සිංහල පුවත්පත්වල ඇතුළත් වූ වෙළෙඳ දැන්වීම්වල අන්තර්ගත හා ආකෘතික ලක්ෂණ විශ්ලේෂණාත්මක විග්‍රහයකට ලක් කිරීමය.

"සාමාජික, සංස්කෘතික හා සාහිත්‍යමය චින්තනය වෙනස් කිරීමෙහිලා ආරම්භක සිංහල පුවත්පත් බලපෑ අයුරු (1862-1900)" මැයෙන් ති.ර.ගා. ඇල බණ්ඩාර මහතා කැලණිය විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍රපති උපාධි නිබන්ධය සඳහා ඉදිරිපත් කළ අධ්‍යයනයේදී සිංහල පුවත්පත්වල පළවූ වෙළෙඳ දැන්වීම්වල අන්තර්ගත හා ආකෘතික ලක්ෂණ ගැන අවධානය යොමු කර නැත.

නිදහස ලැබූ දා සිට 1997 දක්වා වකවානුව තුළ පළවූ සිංහල පුවත්පත් පිළිබඳ අධ්‍යයනයක් ඇතුළත් ශ්‍රී ලංකාවේ මෑත කාලීන පුවත්පත් ඉතිහාසය පිළිබඳ අධ්‍යයනයක් සඳගෝමී කෝපරහේවා මහතා විසින් සිදු කර ඇත.

මේ හැර විශ්ලේෂණාත්මක පර්යේෂණ අධ්‍යයනයන් වශයෙන් සැලකිය නොහැකි, එහෙත් ශ්‍රී ලංකාවේ මුල්කාලීන සිංහල පුවත්පත් පිළිබඳව අධ්‍යයනයන් වශයෙන් වැදගත් වන ග්‍රන්ථ කීපයක් ප්‍රකාශයට පත්ව තිබේ. සිරි තිලකසිරිගේ 19 වන සියවසේ ශ්‍රී ලංකාවෙන් (සිංහල පුවත්පතේ බිළිඳු විය) ආචාර්ය කේ.ඩී.ජී.විමලරත්න මහතා සහ මහාචාර්ය ගාමිනී ඇල බණ්ඩාර ලියූ "ශ්‍රී ලංකාවේ ඉංග්‍රීසි හා සිංහල පුවත්පත්වල ප්‍රභවය සහ විකාශය", මහාචාර්ය තිස්ස කාරියවසම්ගේ "ශ්‍රී ලංකාවේ පුවත්පත් කලාව" (1737-1976) යන කෘතිද ඒ අතරවේ. එහෙත්, මේ සෑම කෘතියකම මුල් කාලීන සිංහල පුවත්වල පළ වූ වෙළෙඳ දැන්වීම් පිළිබඳව අවධානයක් යොමු කර නැත.

මෙම පසුබිම් කරුණු ද සැලකිල්ලට ගන්නා විට 1860-1916 අවදිය තුළ ප්‍රකාශිත සිංහල පුවත්පත්වල ඇතුළත් වූ වෙළඳ දැන්වීම්වල අන්තර්ගත හා ආකෘතික ලක්ෂණ විශ්ලේෂණාත්මක අධ්‍යයනයකට භාජනය කෙරෙන ස්වාධීන පර්යේෂණයක අවශ්‍යතාවක් මතු වේ.

ම විසින් සිදු කෙරෙන මෙම අධ්‍යයනයට පසුබිම නිර්මාණය වූයේ, ඉහත දැක්වූ පර්යේෂණ අවශ්‍යතාවයි.

## 1.3 අරමුණු හා උපන්‍යාසය

1860 ලංකාලෝකය පුවත්පතින් ඇරඹෙන සිංහල පුවත්පත් විකාශනයේ 1916 දක්වා වූ යුගයේදී භාණ්ඩ, සේවා හා අදහස්වලට අදාලව පුවත්පත්වල පළවූ වාණිජ හා වාණිජ නොවන දැන්වීම් පිළිබඳව විශ්ලේෂණාත්මක විග්‍රහයක් කිරීම මෙම පර්යේෂණ නිබන්ධයේ මූඛ්‍ය අරමුණයි. විශේෂයෙන් ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය ඉතිහාසය හැදෑරීමේදී මුල්කාලීන සිංහල පුවත්පත්වල වෙළෙඳ දැන්වීම් ඇතුළත් කිරීම හා බ්‍රිතාන්‍ය යටත් විජිතයක් ලෙස ඒ සඳහා බලපෑ සමාජ ආර්ථික සංසිද්ධීන් පාදක කරගත් පසුබිම් තොරතුරු විචාරාත්මක අධ්‍යයනයකට ලක් කිරීමද මෙම පර්යේෂණයෙන් අරමුණු කෙරේ.

මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණු සංක්ෂිප්ත ලෙස පහත දක්වමි.

1. 1860 -1916 අවදිය තුළ බිහිවූ සිංහල පුවත්පත්හි ඇතුළත් වූ වෙළෙඳ දැන්වීම් කෙරෙහි බලපෑ සමාජ ආර්ථික කරුණු විමසීම.

2. ඉංග්‍රීසි පුවත්පත් දැන්වීම් හා 1860-1916 අතර කාලයේ ප්‍රකාශිත ප්‍රධාන ධාරාවේ සිංහල පත්‍රවල අන්තර්ගත වෙළෙඳ දැන්වීම් පිළිබඳව අධ්‍යයනය කිරීම.

3. සිංහල පුවත්පත් දැන්වීම්වල අන්තර්ගත හා ආකෘතික ලක්ෂණ පිළිබඳව විමර්ශනාත්මකව අධ්‍යයනය කිරීම.

   මෙහිදී දැන්වීම්වල ඇතුළත් ශීර්ෂ පාඨ, පෙළ, භාෂාව, ඉදිරිපත් කිරීමේ රටාව, චිත්‍ර රූ සටහන් හෝ ඡායාරූප භාවිතය, දැන්වීමේ ප්‍රමාණය, පළ කරන ස්ථානය, ඉලක්ක පාරිභෝගික පිරිස, නිර්මාණශීලීත්වය යන කරුණු අධ්‍යයනය කෙරේ.

4. 1860 -1914 අවදියේ සිංහල පුවත්පත්වල පළවූ වෙළෙඳ දැන්වීම්වල අන්තර්ගත හා ආකෘතික ලක්ෂණ ඩී.ආර්.විජයවර්ධන අයිතිය යටතේ 1915/1916 දිනමිණ පත්‍රයේ පළවූ දැන්වීම් සමඟ තුලනාත්මකව විමසීම.

   මෙහිදී, පසුකාලීනව දියුණු පුවත්පත් කලා ලක්ෂණ සහිතව එළිදකින සිංහල පුවත්පත් වෙළඳ දැන්වීම් කෙරෙහි මෙම මුල්කාලීන සිංහල පුවත්පත් වෙළෙඳ දැන්වීම් යම් බලපෑමක් කළේද යන්න සංසන්දනාත්මකව විමසා බැලීමද සිදු කෙරේ. අතීතයට සාපේක්ෂව දැන්වීම්වල සිදුව ඇති වෙනස්කම් සොයා බැලීම මෙහි අරමුණයි.